# අත්හදා බැලීම්වලින් ඔපවත් වූ සනාලිගේ නිර්මාණ





ජීවිතය ජීවත් කරවීමට මිනිසුන් දරණ උත්සාහයන් අපමණය. ඒ අතරිනුත් කාන්තාව ස්වෝත්සාහයෙන් තම නිර්මාණශීලී හැකියාවත් එයට ගැළපෙන ලෙස අවම පිරිවැයක් දරමින් සපයා ගන්නා දේශීය අමුද්‍රව්‍යයත් භාවිත කරමින් තම පවුලේ ආර්ථිකය ශක්තිමත් කැර ගන්නට වෙහෙසෙයි.

මෙයට වසර හයකට පමණ පෙර මාතලේ දිස්ත්‍රික්කයට අයත් ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වහකෝට්ටේ නම් ගමේ ජීවත් වූ නාලින්ද සිය බිරිය වන සනාලි සමඟ ජීවන අරගලය ජය ගන්නට නොයෙක් කර්මාන්තවල යෙදුණේ සිතෙහි පැවති ධෛර්යය නිසාමයි. නමුත් ඒ කිසිදු දෙයකින් නිසි ආදායමක් ලැබීමට හැකියාවක් නොලැබුණු අතර, පවුලේ ආර්ථිකය ද කඩා වැටෙන්නට විය. කෙසේ හෝ ආර්ථිකය ශක්තිමත් කැර ගැනීමට සිතූ සනාලි ස්වෝත්සාහයෙන්ම කිසිදු පුහුණුවකින් තොරව විසිතුරු රෙදි, විවිධ ආයිත්තම් සහ දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් බුදු පුද ට මල් නිර්මාණය ඇරඹුවාය. එලෙස

නිම කළ මලක් මුලින්ම අලෙවි කෙළේ රුපියල් සියයක් වැනි සුළු මුදලකටයි. සනාලි නිවෙසේ රැඳෙමින් මේ මල් සැකසීම සිදු කළ අතර, නාලින්ද ගෙයින් ගෙට ගොස් ඒවා අලෙවි කෙළේය. කාලය එලෙස ගෙවී යද්දී මේ සඳහා පැවති ඉල්ලුම ද දිනෙන් දින ඉහළ යන්නට විය. එයින් ලැබුණු ආදායමෙන් පවුලේ ආර්ථිකය ද යම්තාක් දුරට ශක්තිමත් වන්නට වූයෙන් සනාලිගේ සිත වෙනත් නිර්මාණ කෙරෙහි ද යොමු වූවාය.

ඒ අනුව සිය සැමියාගේ ද උදව් ඇතිව පාවඩ, මුතුකුඩ සහ වටාපත් නිර්මාණයට සනාලි සිත යොමු කළාය. ඒ සඳහා අවශ්‍ය රෙදි, විවිධ විසිතුරු දෑ සහ දේශීය අමුද්‍රව්‍යයක් වන තල් කොළ සොයන්න ට ගත් වෙහෙස සිතූ තරම් පහසු කාර්යයක් නොවීය. නමුත් නාලින්දගේ ද සහාය ඇතිව දින ගණන් වෙහෙසෙමින් අවශ්‍ය දෑ සපයා ගත් සනාලි පළමුවෙන්ම මුතුකුඩයක් සහ වටාපතක් නිර්මාණය කරන්නේ සති දෙකක පමණ කාලයක් වැය කරමිනි. දිවා රෑ වෙහෙසෙමින් කළ මේ නිර්මාණය පළමුවෙන්ම සස සතු කැර පූජා කළහ. බෞද්ධාගමිකයන්ගේ සංස්කෘතිකාංගයක් ලෙස ද සැලකෙන මේ නිර්මාණ කෙරෙහි පවතින්නේ ද ධනාත්මක ආකල්පයකි. එනිසාම මේ කර්මාන්තයේ රඳා පැවැත්ම ගැන සනාලිට සහ නාලින්දට දැඩි විශ්වාසයක් ඇති විය.

එතැන් පටන් මේ කර්මාන්තයට තවත් කිහිප දෙනකු එක් කැර ගෙන ඔවුන්ට ද සාධාරණ වැටුපක් ගෙවීමට සනාලි තීරණය කළාය. එයින් තවත් පිරිසකගේ ආර්ථිකය ශක්තිමත් කරන්නට සනාලිට හැකියාව ලැබිණි. එවගේම මේ නිර්මාණ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයන්නන් ද සොයා ගිය නාලින්ද ඔවුන්ට ද සාධාරණ මිලක් ලබා දුන්නේය. මේ තුළින් තවත් පිරිසකගේ ආර්ථිකය ශක්තිමත් වන්නට පටන් ගත්හ. සාධාරණ මිලත්, නිසි ප්‍රමිතියත් නිසාම මේ අත්කම් සඳහා වෙළෙඳපොළ එතරම් ප්‍රශ්නයක් වූයේ ද නැත. ඒ මන්දයත් පාවඩ, මුතුකුඩ, වටාපත් සධාරණ මිලකට අලෙවි කිරීම නිසාය. ඒවායෙහි සිදු වන නිර්මාණාත්මක වෙනස්කම් අනුව මිලෙහි ද යම් යම් වෙනස්කම් සිදු වෙයි. එමෙන්ම තමාට වුවමනා ආකාරයට මේ නිර්මාණ නිමවා ගැනීමේ හැකියාව ද පවතී.

ඒ අනුව දස දෙනකුට රැකියා අවස්ථා උදා කරමින් කුලියට ගත් මැෂින් කිහිපයක් තම නිවෙසේම තබා ගත් සනාලි මේ කටයුතු සාර්ථකව කැර ගෙන ගියාය. මේ

අතර තම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු නිසි ලෙස කැරගෙන යැමට ද අවශ්‍ය වටාපිටාව නිර්මාණය කිරීමට සනාලි කිසි විටෙක අමතක නොකළාය. විටෙන් විට පැමිණි අගහිඟකම් මේ කිසිදු දෙයකට බාධාවක් කර නොගත් සනාලි සියල්ල සමබරව කැර ගෙන ගියාය.

ඒත් නොසිතූ ලෙස පැමිණි කොවිඩ් වසංගතයත් සමඟ මේ කර්මාන්තයට අභාග්‍ය සම්පන්න කාලයක් උදා විණි. නමුත් එයින් නොවැටුණු සනාලි හැකි පමණින් මේ නිර්මාණකරණයෙහි යෙදුණේ මේ ව්‍යාපාරයට තිබූ දැඩි කැමැත්ත නිසාමයි. නමුත් නිර්මාණකරණයට අවශ්‍ය අමුද්‍රව්‍ය පෙර මෙන් සපයා ගැනීමට නොහැකිවීම තුළ එයින් ලැබූ ආදායම අඩු වුවත් මේ කර්මාන්තය කඩා වැටීමට ඉඩ නොදුන් සනාලි ඉදිරි අනාගතය ගැන කල්පනා කරමින් විදෙස්ගත වීමට තීරණය කළාය. ඒ නාලින්දගේ ද පූර්ණ ආශිර්වාදය ඇතිවයි. එලෙස විදෙස්ගතව උපයන මුදල් ද මේ කර්මාන්තයේ ඉදිරි දියුණුවට ආයෝජනය කිරීම මූලික පරමාර්ථය කැර ගනිමින් මීට මාස හයකට පමණ පෙර සනාලි ගෘහ සේවය සඳහා පිටත්ව ගියාය.

සනාලිගේ එම බලාපොරොත්තුව ඉටු කරමින් නාලින්ද මේ කර්මාන්තය මේ වන විට ඉතා සාර්ථකව කැර ගෙන යයි. සනාලිගේ නිවෙසට පැමිණ මේ කර්මාන්තයට දායකත්ව දුන් පිරිස ද අද තම තමන්ගේ නිවෙස්වල සිට මේ සඳහා දායක වන්නේ සිය ආදායම ද පෙර සේ පවත්වා ගනිමිනි. මේ නිර්මාණවල ඇති නිසි ප්‍රමිතියත්, අලංකාර බවත් නිසාම අද වන විට වෙළෙඳපොළ පිළිබඳ ගැටලුවක් නොමැති බව නාලින් ද පවසයි. වටාපත් සඳහා ඉහළ ඉල්ලුමක් පැවතියත් ඒ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීමේදී පවතින ගැටලුවට විසඳුමක් ලෙස නාලින්ද විකල්ප ක්‍රම අත්හදා බලමින් වටාපත් නව නිමැවුමකින් එළිදක්වන්නට ද උත්සාහයක් දරයි. අද වන විට වෙළෙඳ පොළේ ඉහළ ඉල්ලුමක් පවතින්නේ මුතුකුඩ සහ වටාපත් සඳහා බව ද නාලින්ද පවසයි.

ස්වෝත්සාහයෙන්ම ආරම්භ කළ මේ වටාපත් ඇතුළු අත්කම් නිර්මාණ තමන්ගේම කියූ වෙළෙඳසලක අලෙවි කරමින් ඒ ඔස්සේ තවත් පිරිසකට රැකියා අවස්ථා උදා කිරීමට නුදුරේදීම හැකි වනු ඇතැයි සනාලි තුළ පවතින්නේ දැඩි විශ්වාසයකි. කොතරම් බාධක පැමිණියත් ඒ සියල්ලටම අභියෝග කරමින්

ජීවන අරගලය ජය ගන්නට කාන්තාව තුළ පවතින ශක්තිය සනාලි ලෝකයාටම පසක් කැර දෙන්නේ තමා ලැබූ අත්දැකීම් ඔස්සේමයි.

දිල්හානි ඩයස්

(මධ්‍යම පළාත)

**(මෙම ලිපියේ අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම රචකයා සතුවන අතර, ඊට ගාමණී කොරෙයා පදනම වගකියනු නොලැබේ)**